**ජල සම්පත් මණ්ඩලය - 2016**

---------------------------------------

ජල සම්පත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් පනතේ 17(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

යුද්ධ හමුදාව විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණු ජීප් රථය විධිමත් පරිදි පවරාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

---

එකතුව රු.28,168,520 ක් වූ ණයගැතියන් සහ සේවා අත්තිකාරම් වලට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වෙළඳ ණයගැති ශේෂය රු.19,790,468ක් වූ අතර ඉන් රු.860,800 ක් වර්ෂ 3 කට වඩා පැරණි ශේෂ විය. ශේෂ සනාථ කිරීමේ දී ව්‍යාපෘතියකින් ලැබිය යුතු රු.2,453,295 ක් සඳහා එකඟ නොවන බව දන්වා තිබුණි.

**(ආ)** පුද්ගලයින් 36 දෙනෙකු සහ ආයතන 47 ක් සඳහා විවිධ සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් මණ්ඩලය විසින් රු.21,413,361 ක අත්තිකාරම් ලබා ගෙන තිබුණි. එම අත්තිකාරම්වලින් රු.1,139,371 ක් ලබා ගෙන වසරකට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද අදාළ කාර්යයන් ඉටු කර දීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1964 අංක 29 දරන ජල සම්පත් මණ්ඩල පනත සහ 1999 අංක 42 දරන සංශෝධිත පනතේ 14(1) සහ 14(2) වගන්ති | පනතේ දක්වා ඇති යම් කරුණක් හෝ සියලු කරුණු පිළිබඳව උපදේශක කමිටුව විසින් මණ්ඩලයට උපදෙස් ලබා දිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දී උපදේශක කමිටුව පිහිටුවා නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පර්යේෂණ අධ්‍යයන 11 ක්, උපදෙස් සඳහා කමිටුවේ අවධානයට යොමු කිරීමට නොහැකිවී තිබූ අතර ඒ සඳහා දරන ලද රු.25,003,000 ක පර්යේෂණ වියදම ජල සම්පත් මණ්ඩල පනතේ විධි විධාන ප්‍රකාරව උපදේශක කමිටුව මගින් අනුමත කිරීමද සිදුකර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විද්‍යාත්මක උපකරණ සඳහා ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.7 ඡේදය | වෘත්තීය නිලධාරීන් 28 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වැටුපට අතිරේකව රු.2,519,200 ක විශේෂ දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,094,000 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.99,400,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.126,494,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.60,952,000 කින් අඩුවීම සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ආදායම රු.49,409,000 කින් වැඩිවීම ඉහත අතිරික්තය වැඩි වීමට ප්‍රධාන වශයෙන් තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණද සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී මණ්ඩලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට ධනාත්මකව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.203,383,000 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩලය (සංශෝධිත) පනතේ අංක 12 වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

**(i)** රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම, සංවර්ධනය කිරීම හා ජල මාර්ග අපවිත්‍රවීම වැලැක්වීම.

**(ii)** ජල සම්පත් බහුකාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම, ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටිකාලීනව හා දිගුකාලීනව ජල සම්පත් ලබා දීම, ලවණතාවය පාලනය කිරීම, සහ සමාන අරමුණුවලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

**(iii)** රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන මගින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

**(iv)** භූගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගතයුතු වන වෙනත් ඕනෑම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**(අ)** සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව මගින් විෂයයන් 13 ක් යටතේ පර්යේෂණ ඒකක 3,692 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් පර්යේෂණ ඒකක 2,357ක් පමණක් ඉටුකර තිබූ අතර ඉටු නොකළ ප්‍රමාණය 1335 ක් විය. සමහර කාර්යයන් ඉටු නොකළ ප්‍රමාණය සියයට 13 සිට සියයට 100 ත් අතර පරාසයක විය.

**(ආ) පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්ත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා රු.587,531,400 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන ව්‍යාපෘති 11 ක් ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.104,952,529 ක් වැය කර තිබුණි. මෙම අධ්‍යයන ව්‍යාපෘති වලින් 08 ක් 2016 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණ ද එම ව්‍යාපෘති 08 ම අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

**(ii)** පර්යේෂණ අධ්‍යයන සඳහා වගකීම දරන නිලධාරීන්ගේ පූර්ව පර්යේෂණ පලපුරුද්ද ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අධ්‍යයන යෝජනාවට ඇතුළත්ව නොතිබුණු අතර කිසිදු පර්යේෂණ අධ්‍යයනයක් එම පර්යේෂණ කටයුත්ත සම්බන්ධයෙන් ප්‍රවීන හා පලපුරුදු පර්යේෂකයෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

**(iii)** පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත්කළ යුතු වුවත් මණ්ඩලය විසින් සියලුම පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත්කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ අධ්‍යයනයන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

**(iv)** සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ අධ්‍යයනවල ඇස්තමේන්තුගත මුදලින් ලඟා කර ගත් මූල්‍ය ප්‍රගතිය සියයට 15 සිට සියයට 65 දක්වා පරාසයක වූ අතර එම ව්‍යාපෘතිවල කාල ප්‍රමාදය වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා විය. තවද පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේ දී එයට හේතුව සහ ඇස්තමේන්තුව දක්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහනයකට භාවිතා කරන ලද එංජිමක් සවි කිරීමෙන් පසු එම කාර්යය නියමිත පරිදි ඉටු කළ බවට අදාල නිලධාරීන් විසින් සහතික කර නොතිබිය දී රු. 290,000 ක් ගෙවා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වෙනත් ආයතන සතු වාහන 16 ක් මණ්ඩලය භාවිතා කලද එම වාහන පවරා ගැනීමට 2017 ජුනි දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියාව වැඩපලවල් සහ අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ඉඩම්වල රු.6,258,000 ක මුදලක් වැය කර ගොඩනැගිලි ඉදිකිරීම හා පැවති ගොඩනැගිලි නවීකරණය කිරීම ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අවසන් තොගය තුළ වටිනාකම රු.231,071 ක චලනය නොවන තොග ද රු.3,265,967 ක යල් පැනගිය තොග ද පවතින බව 2013 සිට 2016 දක්වා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් හඳුනාගෙන තිබුණ ද ඒවා සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 66 දෙනෙකු බඳවාගෙන තිබුණ ද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සේවකයින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය ප්‍රකාරව එක් එක් තනතුර වෙනුවෙන් වෙන් වෙන් වූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්විය යුතු වුව ද නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමකින් තොරව වැටුප් වර්ධක ලබා දී තිබුණු අතර ඉහළ තනතුරු සඳහා උසස්වීම් ද ලබා දී තිබුණි.

**4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යයභාරය ඉටු කර ගැනීම සඳහා බඳවා ගත් සේවකයන් 05 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරී සඳහා 2015 වර්ෂයේ සිට මුදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එම සේවකයින්ට රු.1,354,613ක් සහ ඉකුත් වර්ෂයේදී රු.816,897 ක් වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය මගින් දරා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබුණ ද තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ කාර්යයන් විගණනය කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් ප්‍රමාණාත්මක සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේ දී අයිතම 98 ක සියයට 20 සිට සියයට 453 ක් වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

**5.3 ක්‍රියාකාරී සැලැස්ම**

මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී ඉටු කළ යුතු සමස්ත කාර්යය ඉටු කර ගැනීමට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද ඊට අනුකූලව සැසඳිය හැකි ආකාරයට අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ඡේද**

අවුරුදු 06 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ හු විද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. එම මුදාහැරීම සඳහාද වර්ෂ 04 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.435,600 ක ඇප බැඳුම්කරයකට අත්සන් කර තිබුණි. නිලධාරිනිය බැඳී තිබුණු ගිවිසුම් 02 ට අනුකූලව කටයුතු කර නොතිබියදී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරවම මුදාහැර තිබුණද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
| --- | --- | --- |
| **(අ)** | ගිණුම්කරණය | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම හා ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම. |
| **(ආ)** | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම. |
| **(ඇ)** | පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම | සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන නිම කිරීමට කටයුතු නොකිරීම. |
| **(ඈ)** | වත්කම් පාලනය | ජංගම නොවන වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |